# සී/ ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය

# කුරුඳුවත්ත කඩවීදිය

# තනතුරු පුරප්පාඩු

සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුර සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 6/2022 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරන ලද මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2025/06/20 වන දින පෙ.ව. 12.00 ට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් **ගරු සභාපති , සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය, කුරුඳුවත්ත කඩවීදිය**" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය සමග අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ සහතිකවල ඡායා පිටපත් සමග මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයද වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් එවිය යුතුය.

දැනටමත් සමුපකාර සමිතියක සේවයේ නියුතු අයෙක් නම් සමිතිය මඟින් ඉල්ලුම්පත් යොමුකළ යුතු අතර, සමුපකාර සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

සමිතිය විසින් පිළියෙල කරන ලද අයදුම්පත් රාජකාරී දිනවල රු. 500/= මුදලක් ගෙවා සමිති ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත යුතු අතර, සමිතියෙන් නිකුත් කරන ලද අයදුම්පත් පමණක් වලංගුවේ.

| | **තනතුර** | **පුරප්පාඩු ගණන** |
|---|---|---|
| 01 | **සාමාන්‍යාධිකාරී-1** | 01 |

වැ.ප.අ- H:L – 01:01

වැ. ප. - 36000-720X10-1080X10- 1440 X10 = 68400/=

(සේවක විශ්‍රාම වැටුප් හිමිකම්ද ඇති අතර, සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමිය)

වයස් සීමාව - 18-50 අතර

(සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු අයට උපරිම වයස් සීමාව බලනොපානු ඇත)

**සුදුසුකම්**

අ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 11 ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක්/සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක්/ සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර පළපුරුද්දක්/ සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක්/සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත්වී තිබීම (රාජ්‍ය පරිපාලනය/කළමනාකරණය/වාණිජ/ව්‍යාපාර පරිපාලනය/ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමාව සමත්වීම.

**හෝ**

ඇ. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය/පිළිගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාළ විෂයයන් ඇතුළත් මාස 09කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම/පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත්වීම.

**සභාපති, සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**කුරුඳුවත්ත කඩවීදිය.**
0812-352583
2025/05/30